D 34063

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 1 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ජනවාරි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1974 ජනවාරි මස 25 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ
අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 1 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ජනවාරි මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 73/72.

1963 අංක 4 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 1 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනතෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 3 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1963 අංක 4 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයෙහි (i) වන අනුච්ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් අනුච්ඡේදය ආදේශ කිරීමෙන් :—

"(i) (අ) පිත කොමිසමකට යටත් දේපළක පිත කොමිස් භාරකරුවකුගේ අයිතිවාසිකම් පැවරීමෙන් හෝ නැති වී යාමෙන් ඒ අයිතිවාසිකම්වල හිමිකම් පිළිබඳව ඇතිවන යම් වෙනස් වීමක්,

(ආ) දේපළකින් ප්‍රයෝජන ගැනීමේ අයිතිවාසිකමක් පැවරීමෙන් ඒ අයිතිවාසිකමේ හිමිකම පිළිබඳව ඇති වන වෙනස් වීමක්,

(ඇ) ක්ෂයවීම සම්බන්ධයෙන් 10 වන වගන්තිය යටතේ අඩු කිරීමක් සඳහා ඉඩ දෙනු නො ලැබූ යම් මෝටර් වාහනයක හෝ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වූ යම් (ස්වර්ණාභරණ නො වන) ගෘහ භාණ්ඩවල හෝ අන් කිසි භාණ්ඩයක හිමිකම පිළිබඳ වූ වෙනස් වීමක්, හා

(ඈ) යම් දේපළක අයිතිකරු විසින් ඒ දේපළ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට පරිත්‍යාග කිරීමෙන් ඒ දේපළෙහි හිමිකම පිළිබඳව ඇතිවන වෙනස් වීමක්

නො වන, යම් දේපළක් විකිණීමෙන්, බැහැර කිරීමෙන්, පැවරීමෙන්, මුදල් කිරීමෙන්, හුවමාරු කර ගැනීමෙන් හෝ අන් කවර හෝ ආකාරයකින් ඒ දේපළෙහි හිමිකම පිළිබඳව ඇති වන වෙනස් වීම ;"; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (ඒ) ඡේදයෙහි (x) අනුච්ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් අනුච්ඡේදය ආදේශ කිරීමෙන් :—

2—ඒ 03030—12,970(73/11)

"(x) ප්‍රාග්ධනයෙහි ආපසු ගෙවීමක් හෝ බෙදා දීමක් සිදු වූයේ යම් කොටස් සම්බන්ධයෙන් ද ඒ කොටස්වලින් දේපළ සමන්විත වන අවස්ථාවක ඒ කොටස් අත්කර ගනු ලැබූ අවස්ථාවේ දී ඒ දේපළෙහි වටිනාකම—

(අ) ප්‍රාග්ධනයෙන් ආපසු ගෙවන ලද හෝ බෙදා දෙන ලද ප්‍රමාණය මේ පනතේ අර්ථානුකූලව ලාභාංශයක් නොවුවහොත්, 1957 අප්‍රේල් 1 වන දිනට පෙර ඔහු විසින් ඒ කොටස් අත්කර ගනු ලැබුවේ නම් එදිනට හෝ එදිනට පසු ආපසු ගෙවන ලද හෝ බෙදා දෙන ලද ප්‍රාග්ධනයේ ප්‍රමාණය අඩු කර 1957 අප්‍රේල් 1 වන දින ඒ කොටස් වල වෙළෙඳ අගයට සමාන මුදලක් වන්නේ ය, තවද

(ආ) ඔහු විසින් ඒ කොටස් 1957 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසු අත්කර ගනු ලැබුවේ නම්, ප්‍රාග්ධනයෙන් ආපසු ගෙවන ලද හෝ බෙදා දෙන ලද ප්‍රමාණය මේ පනතේ අර්ථානුකූලව ලාභාංශයක් නොවුවහොත් ආපසු ගෙවන ලද හෝ බෙදා දෙන ලද ප්‍රාග්ධනයේ ප්‍රමාණය අඩු කිරීමෙන් පසු ඔහු විසින් ඒ කොටස් අත්කර ගනු ලැබූ අවස්ථාවේ ඒ කොටස් සම්බන්ධයෙන් ඔහුට වූ වටිනාකමට සමාන මුදලක් වන්නේය;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 1971 අංක 33 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත සඳහන් පරිදි තව දුරටත් මෙසින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(අ) (i) යම් පළාත් පාලන ආයතනයක් වෙත හෝ ආණ්ඩුවේ ආයතනයක් වෙත සතු වූ ද නැතහොත් ඒ පළාත් පාලන ආයතනය විසින් හෝ ආණ්ඩුවේ ආයතනය විසින් පරිපාලනය කරනු ලබන්නා වූ ද ඒ පළාත් පාලන ආයතනය හෝ ආණ්ඩුවේ ආයතනය වැඩදායී ලෙස හිමිකම් නො ලැබ සිටින්නා වූ ද යම් භාරයක හෝ වෙනත් කරුණක ආදායම්; සහ

(ii) 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්කර ගනු ලැබූ හෝ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ යම් වෙළෙඳ ව්‍යාපාරයක්, අවස්ථාවෝචිත පරිදි, අත්කර ගැනීමේ හෝ

සතුකර ගැනීමේ දිනයෙහි ආරම්භ වන යම් කාලයක් සඳහා ඒ ව්‍යාපාරයෙහි ලාභ සහ ආදායම

හැර ඒ පළාත් පාලන ආයතනයෙහි හෝ ආණ්ඩුවේ ආයතනයෙහි ආදායම ; ";

(2) ඒ උපවගන්තියෙහි (අ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

" (අඅ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත රක්ෂණ ව්‍යාපාරයට ආරෝපණය කළ හැකි එම සංස්ථාවෙහි 1972 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ලාභ හා ආදායම ;

(අආ) 1973 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා පවුලකට ඇතුළත් නො කරනු ලබන යම් පුද්ගලයකුට අයිති වූ ද ඔහු පදිංචි ව සිටින්නා වූ ද නිවාස ස්ථාන එකකට නො වැඩි සංඛ්‍යාවක ශුද්ධ වාර්ෂික වටිනාකම, හෝ පවුලකට ඇතුළත් කරනු ලබන පුද්ගලයන් සම්බන්ධයෙන් වූ විට ඒ පවුලේ යම් සාමාජිකයකුට අයිති වූ ද ඒ සාමාජිකයා හෝ ඒ පවුලේ වෙන යම් සාමාජිකයකු හෝ පදිංචි ව සිටින්නා වූ ද නිවාස ස්ථාන එකකට නො වැඩි සංඛ්‍යාවක ශුද්ධ වාර්ෂික වටිනාකම ;

(අඇ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයාට ලැබෙන වැටුප සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් ඔහුට සපයා දෙනු ලබන යම් නිවාස ස්ථානයක කුලී වටිනාකම ;

(අඈ) යම් කුඹුරක වගා කරන ලද වී 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ වී අලෙවි මණ්ඩලයට විකිණීමෙන් ඒ කුඹුරේ හිමියා හෝ ගොවියා විසින් 1973 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලබන ලද ලාභ සහ ආදායම ; ";

(3) ඒ උපවගන්තියේ (ඊ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඊ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නො වන්නා වූ ද—

(i) තමා හා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හා අතර හෝ තමා හා ඒ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි යම් ව්‍යවස්ථාපිත සංස්ථාවක් හෝ ආයතනයක් හා අතර 1959 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ඇතිකර ගත් සේවා ගිවිසුමක් අනුව ශ්‍රී ලංකාවෙහි සේවයෙහි යොදවනු ලැබුවා වූ ද ; නැතහොත්

(ii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් හෝ යම් ව්‍යවස්ථාපිත සංස්ථාවක් විසින් හෝ, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ ඒ ව්‍යවස්ථාපිත සංස්ථාව විසින් ප්‍රාග්ධනයට දායක මුදලක් ගෙවනු ලැබුවා වූ ද අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද වෙන යම් සංස්ථාවක් විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක යම් සේවාවක් ඉටු කිරීමෙහි 1969 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට කලින් වූ වර්ෂයේ නියුක්ත ව සිටින්නා වූ ද

යම් විද්‍යාඥයකුගේ, ශිල්පියකුගේ, විශේෂඥයකුගේ හෝ උපදේශකයකුගේ පඩිනඩි හා ශ්‍රී ලංකාවෙහි නූපදින යම් ආදායමක් ; ";

(4) ඒ උපවගන්තියේ (ඵඵ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඵඵ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නො වන්නා වූ ද 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන ඡේදයෙහි හෝ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ක) ඡේදයෙහි සඳහන් යම් ව්‍යාපාරයක අයිතිකරු විසින් 1960 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ලංකාවට ගෙන එනු ලැබ ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන විධායක තත්ත්වයක හෝ අන් තත්ත්වයක සේවයෙහි යොදවනු ලැබුවා වූ ද යම් පුද්ගලයකුගේ, ශ්‍රී ලංකාව තුළ සේවයෙහි යොදවනු ලැබූ දින සිට ගණන් බලනු ලැබූ අවුරුදු තුනක කාලයක් සඳහා වූ පඩිනඩි හා ශ්‍රී ලංකාවෙහි නූපදින යම් ආදායමක් ; ";

(5) ඒ උපවගන්තියේ (ඔඔ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඔඔ) ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නා වූ ද මුදල් අමාත්‍යවරයාගේ අනුමතිය ඇති ව යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ අන්‍ය පුද්ගල මණ්ඩලයක් විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හෝ ලංකා කෘෂි කාර්මික හා කාර්මික ණය සංස්ථාවට හෝ ලංකා සංවර්ධන මුදල් සංස්ථාවට හෝ ලංකා රජයේ උකස් බැංකුවට හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ප්‍රාග්ධනයට දායක මුදල් ගෙවනු ලැබූ අන් කිසි රාජ්‍ය සංස්ථාවකට හෝ ආණ්ඩුවේ ආයතනයකට හෝ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ යම් ව්‍යාපාරයකට හෝ තත් කාලයෙහි ශ්‍රී ලංකාව

තුළ කටයුතු කර ගෙන යන යම් වෙළෙඳ බැංකුවකට ප්‍රදානය කරනු ලැබුවා වූ ද ණය මුදල කින්, 1968 ජූනි 16 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් කාල සීමාවක් සඳහා ඒ සමාගමට, හවුල් ව්‍යාපාරයට හෝ ඒ පුද්ගල මණ්ඩලයට අත් වන්නා වූ පොලිය ; " ;

(6) ඒ උප වගන්තියේ (ත) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ත) තත් කාලයෙහි සහතික දරන්නා වූ පුද්ගලයා විසින් දරනු ලබන සහතිකවල මුදල එම සහතික වලට අදාළ ලිඛිත නීතිය, රීති හෝ නියෝග යටතේ දැරීමට තත් කාලයෙහි පුද්ගලයකුට බලය පැවරෙන ප්‍රමාණයට වැඩි නො වන තාක් කල්, 1973 මාර්තු 31 වන දින හෝ ඊට පෙර යම් පුද්ගලයකු විසින් මිලයට ගන්නා ලද, ඉතිරි කිරීමේ සහතික ආඥාපනත යටතේ නිකුත් කරනු ලැබූ යම් ලංකා ඉතිරි කිරීමේ සහතිකයක් හෝ 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත යටතේ නිකුත් කරනු ලැබූ යම් ජාතික ඉතිරි කිරීමේ සහතිකයක් වෙනුවෙන් ඒ පුද්ගලයාට ගෙවිය හැකි එකතු වූ පොලිය ; " ;

(7) ඒ උපවගන්තියේ (ද) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ද) ලංකා ඉතිරි කිරීමේ බැංකුවෙහි හා ලංකා තැපැල් කාර්යාල ඉතිරි කිරීමේ බැංකුවෙහි යම් පුද්ගලයකුගේ බැරට පවත්නා රුපියල් පහළොස් දහසකට නො වැඩි මුදලක් සඳහා 1972 මාර්තු 31 වන දින ඉකුත් වීමට පෙර අවසන් වන යම් කාලයක් වෙනුවෙන් ගෙවන ලද හෝ බැර කරන ලද පොලිය ; " ; සහ ද

(8) ඒ උපවගන්තියේ (ද) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

" (දඅ) 1973 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට කලින් වූ වර්ෂය සඳහා,—

(අ) 1973 මාර්තු 31 වන දිනයට පසු 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත යටතේ නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබුවේ යයි සැලකෙන යම් ඉතිරි කිරීමේ සහතික ; හා

(ආ) ඒ පුද්ගලයාගේ බැරට ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි පවත්නා මුදල්

වෙනුවෙන් ඒ පුද්ගලයාට ගෙවිය හැකි රුපියල් එක් දහසකට නො වැඩි මුළු පොලිය ; එසේ වුව ද මේ ඡේදය යටතේ දෙනු ලබන නිදහස් කිරීම සඳහා එකම පවුලේ පුද්ගලයන් හය

දෙනකුට වැඩි පිරිසක් සුදුසුව සිටින විට, එවැනි හය දෙනකු වෙනුවෙන් පමණක් ඒ නිදහස් කිරීම අදාළ වන්නේ ය ;

(දආ) වාණිජ බැංකුවක යම් ගිණුමක යම් තැනැත්තකුගේ බැරට පවත්නා මුදල් අතුරින් කොමසාරිස් වරයාගේ මතය අනුව 1971 අංක 53 දරන ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) හා පිටවීමේ අවසර පත්‍ර පනත යටතේ යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවට එවනු ලැබූ මුදල් වන මුදල් ප්‍රමාණයකින් ඒ තැනැත්තාට අයත් වන ආදායම ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 1969 අංක 6 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) මේ වගන්තිය —

(i) 1951 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව පිහිටුවන ලද්දාවූ ද

(අ) ප්‍රාග්ධනයට ශ්‍රී ලංකා ආණ්ඩුව දායක මුදලක් ගෙවන්නා වූ ; සහ

(ආ) ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයකින් අමාත්‍යවරයා විසින් මේ වගන්තිය අදාළ වන සංස්ථාවක් ලෙස 1968 අගෝස්තු 2 වන දිනට කලින් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද

යම් සංස්ථාවකට ද ;

(ii) (අ) ද්‍රව්‍ය හෝ භාණ්ඩ හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කිරීම හෝ සෑදීම සඳහා 1951 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසු ආරම්භ කරන ලද ව්‍යාපාරයක් වීම ;

(ආ) කලින් පැවති යම් ව්‍යාපාරයක් කොටස් කිරීමෙන් හෝ ප්‍රතිසංස්කරණය කිරීමෙන් නැතහොත් 1951 අප්‍රේල් 1 වන දිනට පෙර පවත්වා ගෙන යන ලද වෙළෙඳ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ ගොඩනැගිලි, යන්ත්‍ර හෝ පිරියත් අලුත් වෙළඳ ව්‍යාපාරයකට මාරු කිරීමෙන් ඇති කර ගනු ලැබූ ව්‍යාපාරයක් නො වීම ;

(ඇ) ව්‍යාපාරයේ කාර්යයන් සඳහා පුද්ගලයන් විසිපස් දෙනකුට වැඩි ගණනක් සේවයෙහි යොදවා තිබීම ;

(ඈ) නිෂ්පාදිත හෝ සෑදූ ද්‍රව්‍ය හෝ භාණ්ඩවල තත්ත්වය නියම කිරීම සඳහා බලධරයකු නියම කරනු ලැබ ඇත්නම් සහ එසේ නියම කරනු ලැබ ඇති විට අදාළ ව්‍යාපාරය විසින් නිෂ්පාදනය

කරනු ලැබූ හෝ සාදනු ලැබූ ද්‍රව්‍ය හෝ භාණ්ඩ සතුටුදායක තත්ත්වයක ඇති බව එකී බලධරයා විසින් සහතික කරනු ලැබ තිබීම; සහ

(ඉ) ද්‍රව්‍ය හෝ භාණ්ඩ විකිණිය යුතු මිල නියම කිරීම සඳහා බලධරයකු නියම කරනු ලැබ ඇත්නම් සහ එසේ නියම කරනු ලැබ ඇති විට, ද්‍රව්‍ය හෝ භාණ්ඩ විකුණනු ලබන මිල සාධාරණ ය යි එකී බලධරයා විසින් සහතික කරනු ලැබ තිබීම;

යන කොන්දේසි සපුරාලන කාර්මික ව්‍යාපාරයක් බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වන යම් කාර්මික ව්‍යාපාරයකට ද;

(iii) 1968 අගෝස්තු 2 වන දිනට කලින් අරඹන ලද දියබ මුහුදේ මසුන් මැරීමේ ව්‍යාපාරයකට ද;

(iv) යම් කාර්යයක් සඳහා යම් ඉඩමක් බදු දීමට ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ හෝ පළ කරනු ලැබිය හැකි නිවේදනයකට අනුකූලව බදු දෙන ලද යම් ඉඩමක, 1968 අගෝස්තු 2 වන දිනට පෙරාතුව එම කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් පිට ඒ බද්ද අනුමත කරන ලද්දේ නම්, ඒ කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලබන යම් ව්‍යාපාරය කට ද;

(v) සංචාරකයන් සඳහා හෝටල් පවත්වාගෙන යාමට ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අනුමත කරනු ලැබුවා වූද 1966 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ කරනු ලැබුවා වූද යම් ව්‍යාපාරයකට ද;

(vi) ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අමාත්‍ය වරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් මගින් අනුමත කරනු ලැබුවා වූද, (v) වන ඡේදයේ සඳහන් කරනු ලැබුවා වූද ව්‍යාපාරයක ප්‍රයෝජනය සඳහා ගොඩනැගිලි සැපයීමේ යම් ව්‍යාපාරයකට ද

අදාළ වන්නේ ය:

එසේ වුව ද 1969 අප්‍රේල් 1 වන දින හෝ එදිනට පසු ශ්‍රී ලංකා වෙහි දී භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය හෝ සෑදීම ආරම්භ කරන යම් කාර්මික ව්‍යාපාරයක් සම්බන්ධයෙන්, ඒ ව්‍යාපාරය (ii) වන ඡේදයේ විස්තර කර ඇති කොන්දේසි සපුරා ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුව හොත් මිස සහ ඒ ව්‍යාපාරය—

(අ) (i) සමාගමක් නම් ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් වූ යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩල යක් විසින් සාමාන්‍ය කොටස් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් දරන්නා වූ හෝ එය සමාගමක් නොවේ නම් ශ්‍රී ලංකාවෙන් පිටත සමාගමක්, හවුල්

ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සපයන ලද ප්‍රාග්ධනයක් ඇත්තා වූ ද,

(ii) ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත ස්ථිර ලේකම්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් පිට, කර්මාන්ත සංවර්ධන අධ්‍යක්ෂ විසින් 1968 අගෝස්තු 2 වන දිනට පෙරාතුව අනුමත කරනු ලැබුවා වූ ද,

(iii) ශ්‍රී ලංකාවේදී භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය හෝ සෑදීම 1972 මාර්තු 31 වන දින හෝ ඊට කලින් ආරම්භ කළා වූ ද

ව්‍යාපාරයක් නම්; හෝ

(ආ) (i) කර්මාන්ත සංවර්ධන අධ්‍යක්ෂ විසින් 1968 අගෝස්තු 2 වන දිනට කලින් අනුමත කරනු ලැබුවා වූ ද,

(ii) ව්‍යාපාරයේ කාර්යයන් සඳහා යම් ඉඩමක්, යම් පිරියතක්, යන්ත්‍ර, සවි කිරීම් කිසිවක් හෝ ගොඩනැගිල්ලක් 1968 අගෝස්තු 2 වන දිනට පෙරාතුව අත්පත් කරගත්තා ලද බවට හෝ ඒ ව්‍යාපාරයේ කාර්යයන් සඳහා යම් ඉඩමක්, පිරියත්, යන්ත්‍ර හෝ සවිකිරීම් කිසිවක් මිලදී ගැනීම පිණිස හෝ එකී ව්‍යාපාරයේ කාර්යයන් සඳහා යම් ගොඩනැගිල්ලක් මිලයට ගැනීම හෝ ඉදි කිරීම සඳහා වූ ගිවිසුමක් ඒ දිනයට පෙරාතුව ඇති කර ගත්තා ලද බවට හෝ කොමසාරිස් වරයා සෑහීමට පත්ව ඇත්තා වූ ද,

(iii) ශ්‍රී ලංකාවේ දී භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය හෝ සෑදීම 1972 මාර්තු 31 වන දින හෝ ඊට කලින් ආරම්භ කර ඇත්තා වූ ද

ව්‍යාපාරයක් නම්; හෝ

මිස මේ වගන්තිය ඒ ව්‍යාපාරයට අදාල නොවන්නේ ය.".

7ආ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

5. (1) මෙහි පහත සඳහන් අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 7ආ වන වගන්තිය ලෙස බල පැවැත්වෙන්නේ ය :—

"6 වන වගන්තියේ හෝ 7අ වන වගන්තියේ විධිවිධාන අදාළ වන යම් ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තකුගේ ආදායම සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

7ආ. 6 වන වගන්තිය හෝ 7අ වන වගන්තිය අදාළ වන යම් ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තකු, ඔහු විසින් ඉදි කරනු ලැබ ඒ ව්‍යාපාරයේ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ ඒ ව්‍යාපාරයේ කාර්යයන් සඳහා ඔහු විසින් අත්කරගනු ලැබ පාවිච්චි කරනු ලබන යම් පිරියතක්, යන්ත්‍ර හෝ සවි කිරීම් විකුණුවහොත්, අත්හරිනු ලැබුවහොත් හෝ අන්‍යාකාරයකින් බැහැර කළහොත්, නැතහොත් මරණය හැර වෙනත් හේතුවක් නිසා තවදුරටත් ඒවායේ අයිතිකරුවීම අවසන් කළහොත්, අවසානෝචිත

පරිදි 6 වන වගන්තියේ හෝ 7අ වන වගන්තියේ කුමක් සඳහන්ව ඇතද, ඒ තැනැත්තා බදු ගෙවිය යුතු ආදායමට—

(අ) ඒ තැනැත්තා ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාම අවසන් කර සිටීම හෝ නො සිටීම අනුව 10 වන වගන්තියේ (3) වන උප වගන්තිය හෝ (4) වන උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලැබූ මුදලක්; සහ

(ආ) 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඕ) ඡේදය යටතේ හෝ (ක) ඡේදය යටතේ හෝ ඒ ව්‍යාපාරයේ ලැබීම් වශයෙන් සැලකෙන මුදල්; සහ

(ඇ) ඒ තැනැත්තා එම ව්‍යාපාරය කරගෙන යාම අවසන් කර ඇත්නම් එකී ගොඩ නැගිල්ලේ, පිරියත්වල හෝ යන්ත්‍රවල හෝ සවිකිරීම්වල අයිතිය මාරුවීම හේතු කොටගෙන ඇති වන ශුද්ධ ප්‍රාග්ධන ලාභ

විකුණන ලද හෝ අත් හරින ලද නැතහොත් අන්‍යාකාරයකින් බැහැර කරන ලද හෝ අන්‍යාකාරයකින් අයිතිය අවසන්වුණු දේ සම්බන්ධයෙන්, 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඌ) ඡේදය හෝ (එ) ඡේදය හෝ (ඕ) ඡේදය හෝ (ක) ඡේදය හෝ ක්‍ෂයවීම වෙනුවෙන් අඩු කිරීමක් කර ඇත්තාක් සේ සලකා ඇතුළත් වන්නේ ය."

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරන ලද 7ආ වන අලුත් වගන්තියේ විධිවිධාන, 1973 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ම අදාළ වන්නේ ය.

**6.** (1) 1968 අංක 26 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙහි පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(i) ඒ උපවගන්තියෙහි (එ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(එ) (අ) ඒ තැනැත්තා විසින් (5) වන උපවගන්තියෙහි අර්ථානුකූලව පවත්වා ගෙන යනු ලබන යම් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපාරයක නැතහොත් යම් අනුමත යෝජනා ක්‍රමයක කාර්යය සඳහා—

(i) කාර්ය මණ්ඩල සුභ සාධක ගොඩනැගිල්ලක් වශයෙන් ප්‍රයෝජන ගැනීම පිණිස, හෝ

(ii) ඒ තැනැත්තා විසින් ඒ ව්‍යාපාරයෙහි හෝ යෝජනා ක්‍රමයෙහි සේවයෙහි යොදවනු ලැබූ කණිෂ්ඨ සේවක මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් නිවාසයක් වශයෙන් පදිංචිව සිටිනු පිණිස, හෝ

(iii) ඒ ව්‍යාපාරයේ හෝ යෝජනා ක්‍රමයේ කාර්යයන් සඳහා නිවාසයක් වශයෙන් හැර අන් ආකාරයකින් පදිංචිව සිටිනු පිණිස, හෝ

(ආ) ඒ තැනැත්තා විසින් පවත්වා ගෙන යනු ලබන කර්මාන්තයක හෝ වෙළෙඳ ව්‍යාපාරයක කාර්යය සඳහා ගුදමක් වශයෙන් පමණක් ප්‍රයෝජන ගැනීම සඳහා

තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයෙහි ඉදි කරන ලද යම් ගොඩනැගිල්ලක් වැනැරීමෙන් හෝ ගෙවී යෑමෙන් හෝ එහි අගය ක්ෂයවීම සම්බන්ධයෙන් එකවර ලැබෙන නියමිත මුදලක් :

එසේ වුව ද ඒ තැනැත්තා විසින් කලින් පාවිච්චි කරන ලද යම් ගොඩනැගිල්ලක් මේ ඡේදයෙහි ඉහත සඳහන් විධිවිධානවල නිශ්චිත ව සඳහන් කාර්යයන්ගෙන් යම් කාර්යයක් සඳහා අලුත්වැඩියා කිරීම පිණිස ඉදි කිරීම කරන ලද්දේ නම් සහ (ඒ) ඡේදය යටතේ වූ අඩු කිරීමක් වශයෙන් එම අලුත්වැඩියා කිරීමේ වියදමට අවසර දෙනු ලැබේ නම්, ඒ තැනැත්තා විසින් ඉදි කරන ලද යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් මේ ඡේදයෙහි ඉහත දැක්වුණු විධිවිධාන යටතේ කිසිම අඩු කිරීමකට හිමිකම් ලැබීමට ඒ තැනැත්තාට අවසර නොදිය යුතු ය." ;

(ii) ඒ උපවගන්තියේ (ක) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ක) ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අමාත්‍යවරයා විසින් මේ ඡේදයේ කාර්යයන් සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින් අනුමත කරන ලද්ද වූ ද, 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන ඡේදයේ සඳහන් කර නොමැති, සංචාරකයින් සඳහා වූ හෝටල් පැවැත්වීමේ යම් ව්‍යාපාරයක් සඳහා එවැනි තැනැත්තකු විසින්, යම් පිරියතක්, යන්ත්‍ර, සවි කිරීම්, ගෘහභාණ්ඩ, උපකරණ හෝ භාණ්ඩ අවස්ථාවෝචිත පරිදි මිලට ගැනීම සහ

සවි කිරීම හෝ මිලදී ගැනීම සඳහා හෝ පවත්නා ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කිරීම, එයට අලුතෙන් කොටස් එකතු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා හෝ යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා හෝ වියදම් කරන ලද යම් මුදලක් :

එසේ වුව ද ඒ තැනැත්තා, ලාභ නිශ්චය කරනු ලබන කාලසීමාව තුළදී, එම ව්‍යාපාරය කරගෙන යාම නොනවත්වා, එවැනි යම් පිරියතක්, යන්ත්‍ර, සවි කිරීම්, ගෘහභාණ්ඩ, උපකරණ හෝ භාණ්ඩ විකුණා ඇති විට, අත්හැරදමා ඇති විට, අන්‍යාකාරයකින් බැහැර කර ඇති විට හෝ එබන්දක අයිති කරුවීම අවසන් කර ඇති විට, එම විකිණීමෙන්, අත්හැර ලෑමෙන්, අන්‍යාකාරයකින් බැහැර කිරීමෙන් හෝ අයිතිකරුවීම අන් ලෙසකින් අවසන් කිරීමෙන් ලැබූ මුදල එකී ව්‍යාපාරයේ ලැබීමක් ලෙස සැලකිය යුතු ය." ;

(ආ) ඒ වගන්තියෙහි (3) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) 1957 මාර්තු 31 වන දිනට හෝ (2) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලබන යම් නියමිත දිනකට හෝ පසුව තමා විසින් අත් කර ගන්නා ලද්දා වූ ද තමා විසින් පවත්වා ගෙන යනු ලබන හෝ කරගෙන යනු ලබන යම් කර්මාන්තයකින්, වෙළෙඳ ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රක්ෂාවකින් හෝ සේවා නියුක්තියකින් ආදායම නිපදවීමෙහි ලා පාවිච්චි කරනු ලබන්නා වූ ද යම් පිරියතක්, යන්ත්‍ර හෝ සවි කිරීම් හෝ 1957 මාර්තු 31 වන දිනට හෝ (2) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලබන යම් නියමිත දිනකට හෝ පසුව ඉදිකරන ලද්දා වූත්—

(අ) කාර්ය මණ්ඩල ගෘහ සාධක ගොඩනැගිල්ලක් වූ හෝ යම් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපාරයක හෝ එහි කාර්‍ය්‍යය සඳහා හෝ ඊට සම්බන්ධව හෝ ඔහු විසින් සේවයෙහි යොදවනු ලබන කණිෂ්ඨ සේවක මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් නිවාසයක් වශයෙන් ප්‍රයෝජන ගැනීම පිණිස ඇති ගොඩනැගිල්ලක් වූ හෝ නිවාසයක් වශයෙන් හැර අන් ලෙසකින් ඒ ව්‍යාපාරයේ කාර්ය සඳහා භුක්ති විඳිනු ලබන ගොඩනැගිල්ලක් වූත් ; නැතහොත්

(ආ) ඔහු විසින් පවත්වා ගෙන යනු ලබන යම් කර්මාන්තයක හෝ වෙළෙඳ ව්‍යාපාරයක කාර්යය සඳහා හුදෙක් ගුදමක් වශයෙන් ප්‍රයෝජන ගැනීම පිණිස ඇති ගොඩනැගිල්ලක් වූත්

යම් ගොඩනැගිල්ලක් යම් තැනැත්තකු විකුණන විට, අත්හරින විට, අන්‍යාකාරයකින් බැහැර කරන විට හෝ එහි අයිතිකරුවීම අන් ලෙසකින් අවසන් කරන විට සහ ඒ විකිණීම හෝ අත් හැරීම හෝ අන්‍යාකාර බැහැර කිරීම හෝ අයිතිය අන් ලෙසකින් අවසන් කිරීම ඔහු ඒ කර්මාන්තය, වෙළෙඳ ව්‍යාපාරය, වෘත්තිය, රක්ෂාව, සේවා නියුක්තිය හෝ ව්‍යාපාරය පවත්වා ගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම අවසන් කරන කල්හි හෝ අවසන් කිරීමෙන් පසු සිදුවන කල්හි සහ විකුණන ලද හෝ අත්හරින ලද හෝ අන් ලෙසකින් බැහැර කරන ලද හෝ අන් ලෙසකින් අයිතිය අවසන් කරන ලද ද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්ෂය වීම සඳහා අඩු කිරීමක් (1) වන උපවගන්තියේ (ඌ) ඡේදය යටතේ හෝ (එ) ඡේදය යටතේ කර ඇති කල්හි, ක්ෂයවීම සඳහා අඩු කිරීම නිශ්චය කරන ලද්දේ එම දේපළ ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි කාලසීමාව සලකා බැලීමෙන් ද ඒ කාලසීමාව ඉකුත්වීමට පෙර එම විකිණීම හෝ අන්‍යාකාරයකින් අයිතිය බැහැර කිරීම හෝ අන් ලෙසකින් අයිතිය අවසන් කිරීම හෝ සිදු වුවහොත්, කොමසාරිස්වරයාගේ මතය පරිදි ඒ කාලසීමාවෙන් ඉකුත් නොවී ඇති කොටසට ආරෝපණය කළ හැකි වූ ද ක්ෂයවීම සඳහා අඩු කරන ලද්දාවූ ද මුදලෙහි කොටස ඒ කර්මාන්තයෙන්, වෙළෙඳ ව්‍යාපාරයෙන්, වෘත්තියෙන්, රක්ෂාවෙන්, සේවා නියුක්තියෙන් හෝ ව්‍යාපාරයෙන් වූ ලැබීමක් ලෙස ඒ තැනැත්තාගේ ලාභවලට හෝ ආදායමට එකතු කළ යුතු ය.";

(ඇ) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) 1957 මාර්තු 31 වන දිනට හෝ (2) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලබන යම් නියමිත දිනකට හෝ පසුව තමා විසින් අත්කර ගන්නා ලද්දා වූ ද තමා විසින් පවත්වා ගෙන යනු ලබන හෝ කරගෙන යනු ලබන යම් කර්මාන්තයකින්, වෙළෙඳ ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රක්ෂාවකින්, හෝ සේවා නියුක්තියකින් ආදායම නිපදවීමෙහි ලා පාවිච්චි කරනු ලබන්නා වූ ද යම් පිරියතක්, යන්ත්‍ර හෝ සවිකිරිම් හෝ 1957 මාර්තු 31 වන දිනට හෝ (2) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලබන යම් නියමිත දිනකට හෝ පසුව ඉදි කරන ලද්දා වූත්—

(අ) කාර්ය මණ්ඩල ශුභ සාධක ගොඩනැගිල්ලක් වූ හෝ යම් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපාරයක හෝ එහි කාර්යයන් සඳහා හෝ ඊට සම්බන්ධ ව හෝ ඔහු විසින් සේවයෙහි යොදවනු ලබන කණිෂ්ඨ සේවක මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් නිවාසයක් වශයෙන් ප්‍රයෝජන ගැනීම පිණිස ඇති ගොඩනැගිල්ලක් වූ හෝ නිවාසයක් වශයෙන් හැර අන් ලෙසකින් එම ව්‍යාපාරයෙහි කාර්යයන් සඳහා බුක්ති විඳිනු ලබන ගොඩනැගිල්ලක් වූත්, නැතහොත්

(ආ) ඔහු විසින් පවත්වාගෙන යනු ලබන යම් කර්මාන්තයක හෝ වෙළෙඳ ව්‍යාපාරයක කාර්යයන් සඳහා ගුදමක් වශයෙන් පමණක් ප්‍රයෝජන ගැනීම පිණිස ඇති ගොඩනැගිල්ලක් වූත්

යම් ගොඩනැගිල්ලක් යම් තැනැත්තකු විකුණන විට, අත් හරින විට, අන්‍යාකාරයකින් බැහැර කරන විට හෝ එහි අයිතිකරු වීම අන් ලෙසකින් අවසන් කරන විට සහ ඒ විකිණීම හෝ අත් හැරීම හෝ අන්‍යාකාර බැහැර කිරීම හෝ අයිතිය අන් ලෙසකින් අවසන් කිරීම ඔහු ඒ කර්මාන්තය, වෙළෙඳ ව්‍යාපාරය, වෘත්තිය, රක්ෂාව, සේවා නියුක්තිය හෝ ව්‍යාපාරය පවත්වා ගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම අවසන් නොකොට සිදු වන කල්හි සහ විකුණන ලද හෝ අත් හරින ලද හෝ අන් ලෙසකින් බැහැර කරන ලද හෝ අන් ලෙසකින් අයිතිය අවසන් කරන ලද ද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්ෂයවීම සඳහා වූ අඩු කිරීමක් (1) වන උපවගන්තියේ (ඌ) ඡේදය හෝ (එ) ඡේදය යටතේ කර ඇති කල්හි—

(i) ක්ෂයවීම සඳහා වූ අඩු කිරීම නිශ්චය කරන ලද්දේ එම දේපළ ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි කාල සීමාව සලකා බැලීමෙන් ද ඒ කාල සීමාව ඉකුත් වීමට පෙර එම විකිණීම හෝ අත් හැරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ අන් ලෙසකින් අයිතිය අවසන් කිරීම හෝ සිදු වුවහොත් ඒ කාල සීමාවේ ඉකුත් නොවී ඇති කොටස කොමසාරිස්වරයා විසින් සැලකිල්ලට භාජන කොට, විකිණීමක දී එම විකිණීමෙන් හෝ අත් හැරීමක දී හෝ වෙනත් බැහැර කිරීමක දී හෝ අන් ලෙසකින් අයිතිය අවසන් කිරීමක දී ඒ පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් සිදු විය හැකි විකිණීමෙන් ඇති වන පාඩුවේ ප්‍රමාණය හෝ ලාභයේ ප්‍රමාණය නිශ්චය කළ යුතු අතර, පාඩුවේ ප්‍රමාණය එලෙස නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, (1) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් කාර්යය සඳහා එම ප්‍රමාණය අඩු කරනු ලැබිය යුතු ය. තවද ලාභයේ ප්‍රමාණය එලෙස නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, ඒ කර්මාන්තයෙන්, වෙළෙඳ ව්‍යාපාරයෙන්, වෘත්තියෙන්, රක්ෂාවෙන්, සේවා නියුක්තියෙන් හෝ ව්‍යාපාරයෙන් වූ ලැබීමක් ලෙස එම ප්‍රමාණය ඒ තැනැත්තාගේ ලාභවලට හෝ ආදායමට එකතු කරනු ලැබිය යුතු අතර, ඒ කර්මාන්තය, වෙළෙඳ ව්‍යාපාරය, වෘත්තිය, රක්ෂාව හෝ සේවා නියුක්තිය සඳහා ඒ පිරියතෙහි, යන්ත්‍රවල හෝ සවිකිරීම්වල කොටසක් පමණක් පාවිච්චි කරනු ලැබූ හෝ උපයෝගි කරගනු ලැබූ අවස්ථාවක, නැතහොත් එම ගොඩනැගිල්ලේ කොටසක් පමණක් එම ව්‍යාපාරයේ කාර්යයන් සඳහා හෝ ඊට

සම්බන්ධ ව පාවිච්චි කරනු ලැබූ අවස්ථාවක, මෙම උපවගන්තිය යටතේ වූ අඩු කිරීම හෝ එකතු කිරීම ප්‍රමාණානුකූලව ඌන කරනු ලැබිය යුතු ය; තව ද

(ii) එම විකිණීම හෝ අත් හැරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ අන් ලෙසකින් අයිතිය අවසන් කිරීම ඒ භාණ්ඩ ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ඉහත කී කාල සීමාව ඉකුත්වීමෙන් පසුව සිදු වේ නම්, විකිණීමක් සිදු වුවහොත් විකිණීමෙන් ලත් මුදලේ සම්පූර්ණ ප්‍රමාණය හෝ අත් හැරීමක් හෝ අන්‍යාකාර බැහැර කිරීමක් හෝ අන් ලෙසකින් අයිතිය අවසන් කිරීමක් සිදු වුවහොත් ඒ පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ ගොඩනැගිල්ල විකිණීමෙන් අත් කර ගනු ලැබිය හැකි සම්පූර්ණ මුදල ඒ කර්මාන්තයෙන්, වෙළෙඳ ව්‍යාපාරයෙන්, වෘත්තියෙන්, රක්ෂාවෙන්, සේවා නියුක්තියෙන් හෝ ව්‍යාපාරයෙන් වූ ලැබීමක් ලෙස ඒ තැනැත්තාගේ ලාභවලට හෝ ආදායමට එකතු කරනු ලැබිය යුතු ය; තව ද විකිණීමක්, අත් හැරීමක් හෝ වෙනත් බැහැර කිරීමක් සිදු වුවහොත් ඒ කර්මාන්තය, වෙළෙඳ ව්‍යාපාරය, වෘත්තිය, රක්ෂාව හෝ සේවා නියුක්තිය සඳහා ඒ පිරියතෙහි යන්ත්‍රවල හෝ සවි කිරීම්වල කොටසක් පමණක් පාවිච්චි කරනු ලැබූ හෝ උපයෝගී කර ගනු ලැබූ අවස්ථාවක, නැතහොත් එම ගොඩනැගිල්ලේ කොටසක් පමණක් එම ව්‍යාපාරයේ කාර්යයන් සඳහා හෝ ඊට සම්බන්ධව පාවිච්චි කරනු ලැබූ අවස්ථාවක, මෙම උපවගන්තිය යටතේ වූ එකතු කිරීම ප්‍රමාණානුකූලව ඌන කරනු ලැබිය යුතු ය."; සහ

(ඇ) ඒ වගන්තිය අගට මෙහි පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(9) යම් තැනැත්තකු විසින් ඉදිකර හෝ අත් කර ගෙන ඇති යම් ගොඩනැගිල්ලක්, පිරියතක්, යන්ත්‍ර හෝ සවිකිරීම් සම්බන්ධයෙන් (1) (අ) වන හෝ (1) (ඌ) වන හෝ (1) (එ) වන උපවගන්ති යටතේ පාවිච්චිය සහ ගෙවී යාම නිසා ක්ෂයවීම වෙනුවෙන් හෝ (1) (ඒ) උපවගන්තිය යටතේ, අලුත් කිරීම සඳහා වැය කරන ලද යම් මුදලක් වෙනුවෙන් හෝ—

(අ) ඒ තැනැත්තා විසින්—

(i) ඒ ගොඩනැගිල්ල, පිරියත, යන්ත්‍ර හෝ සවිකිරීම්, 6 වන හෝ 7අ වන වගන්තිය යටතේ ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ යම් ව්‍යාපාරයකට කුලියට දී ඇත්නම්; හෝ

(ii) ඒ පිරියත, යන්ත්‍ර හෝ සවිකිරීම් අත් කර ගන්නා ලද්දේ යමකු ගෙන් ද ඔහු හෝ ඔහු ගේ පවුලේ වෙනත් සාමාජිකයකු හෝ ඔහු නැතහොත් ඔහුගේ පවුලේ වෙනත් සාමාජිකයකු යම් තැනැත්තකු හෝ තැනැත්තන් සමග හවුලේ හෝ කර ගෙන යන යම් ව්‍යාපාරයකට කුලියට දී ඇත් නම්; හෝ

(ආ) ඒ පිරියත, යන්ත්‍ර හෝ සවිකිරීම් අත් කර ගන්නා ලද්දේ යමකුගෙන් ද ඔහු සමග හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකු සමග හවුලේ කර ගෙන යන යම් ව්‍යාපාරයක් සඳහා ඒ පිරියත, යන්ත්‍ර හෝ සවිකිරීම් පැවිච්චි කරන්නේ නම්

කිසිම අඩු කිරීමක් නොකළ යුතු ය :

එසේ වුවද මේ උපවගන්තියේ පෙරාතුව වූ විධිවිධාන කිසිවක්, 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (vi) වන ඡේදයේ සඳහන් යම් ව්‍යාපාරයක් කර ගෙන යන කිසිම තැනැත්තකුට අදාළ නොවන්නේ ය.".

(2) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුච්ඡේදයෙන්, (ආ) ඡේදයෙන්, (ඇ) ඡේදයෙන් සහ (ඈ) ඡේදයෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරන ලද සංශෝධනය 1973 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව හෝ ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ම අදාළ වන්නේ ය ; තවද

(ආ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි (ii) වන අනුච්ඡේදයෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරන ලද සංශෝධනය 1968 ජූනි 16 වන දින වලංගු වී ඇතැයි සැලකිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"පවුලක් ලෙස සැලකෙන පුද්ගලයෝ.

19. (1) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් නේවාසික පුද්ගලයකු විසින් මේ පනත යටතේ සපයනු ලැබූ ආදායම් වාර්තාවක් අනුව, ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයෙහි ඔහුට භාර්යාවක් සිටියේ නම් සහ දරුවෙක් හෝ යැපෙන ඥාතියෙක් නොසිටියේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔවුන් සම්බන්ධයෙන් ආදායම ගණන් බැලීමේ කාර්යය සඳහා ඔවුන් පවුලක් ලෙස සැලකිය යුතු අතර ඒ පුද්ගලයා ඒ පවුලෙහි ප්‍රධානයා ලෙස සැලකිය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් නේවාසික පුද්ගලයකු විසින් මේ පනත යටතේ සපයනු ලැබූ ආදායම් වාර්තාවක් අනුව, ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයෙහි ඒ තැනැත්තාට භාර්යාවක සහ (හුදෙක් සේවා නියුක්තියෙන් ලැබෙන ආදායමක් වන ආදායමක් ලබන දරුවකු නොවන) යම් දරුවෙක් හෝ යැපෙන ඥාතියෙක් සිටියේ නම් ඒ තක්සේරු වර්ෂය සඳහා ඔවුන් සම්බන්ධයෙන් ආදායම් බද්ද ගණන් බැලීමේ කාර්යය සඳහා ඔවුන් පවුලක් ලෙස සැලකිය යුතු අතර ඒ පුද්ගලයා ඒ පවුලෙහි ප්‍රධානයා ලෙස සැලකිය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ තැනැත්තකු නොවන යම් නේවාසික පුද්ගලයකු විසින්, මේ පනත යටතේ සපයනු ලැබූ ආදායම් වාර්තාවක් අනුව ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයෙහි ඒ තැනැත්තාට (හුදෙක් සේවා නියුක්තියෙන් ආදායමක් වන ආදායමක් ලබන දරුවකු නොවන) යම් දරුවෙක් හෝ යැපෙන ඥාතියෙක් සිටියේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔවුන් සම්බන්ධයෙන් ආදායම් බද්ද ගණන් බැලීමේ කාර්යය සඳහා ඒ පුද්ගලයා හා ඒ දරුවා හෝ යැපෙන ඥාතියා පවුලක් ලෙස සැලකිය යුතු අතර ඒ පුද්ගලයා ඒ පවුලෙහි ප්‍රධානයා ලෙස සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. 1969 අංක 6 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙහි පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (ඈ) සහ (ඉ) ඡේද වෙනුවට පහත සඳහන් අලුත් ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඈ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන කොටසෙහි විධිවිධාන, 1965 අප්‍රේල් 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් හා ඊළඟට එන තක්සේරු වර්ෂ තුනෙන් එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් එම පුද්ගලයාට අදාළ වීමෙහි දී, අවස්ථාවෝචිත පරිදි, එම උපලේඛනයේ එම කොටසෙහි සඳහන් එක් එක් මුදල නැතහොත් 23අ වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි සඳහන් ආකාරයට ගණන් බලන ලද මුදල්වල මුළු එකතුව, ඔහු නේවාසිකව සිටි දවස් ගණන හා ඒ කලින් වර්ෂයේ දවස් ගණන හා අතර අනුපාතය අනුව අඩු කරනු ලැබූ ලෙස බල පැවැත්වෙන්නේය.

(ඉ) මේ පනතෙහි දෙවන උපලේඛනයේ IV වන කොටසේ විධිවිධාන 1969 අප්‍රේල් 1 වන දින සිට ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් සහ ඊළඟට එන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, ඒ පුද්ගලයාට අදාළ වීමේදී, අවස්ථාවෝචිත පරිදි, ඒ උපලේඛනයේ ඒ කොටසෙහි සඳහන් මුදල්වලින් එක් එක් මුදල නැතහොත් 23අ වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි සඳහන් ආකාරයට ගණන් බලන ලද මුදල්වල මුළු එකතුව, ඔහු නේවාසිකව සිටි දවස් ගණන හා ඒ කලින් වර්ෂයේ දවස් ගණන හා අතර අනුපාතය අනුව, අඩු කරනු ලැබූ ලෙස බල පැවැත්වෙන්නේ ය; තවද"; සහ

(2) ඒ වගන්තිය අගට පහත සඳහන් අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඊ) මේ පනතෙහි දෙවන උපලේඛනයේ V වන කොටසේ විධිවිධාන 1971 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්, එම පුද්ගලයාට අදාළ වීමෙහි දී, අවස්ථාවෝචිත පරිදි, එම උපලේඛනයේ එම කොටසෙහි සඳහන් එක් එක් මුදල නැතහොත් 23අ වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි සඳහන් ආකාරයට ගණන් බලන ලද මුදල්වල මුළු එකතුව, ඔහු නේවාසිකව සිටි දවස් ගණන හා ඒ කලින් වර්ෂයේ දවස් ගණන හා අතර අනුපාතය අනුව අඩු කරනු ලැබූ ලෙස බල පැවැත්වෙන්නේ ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ, (ණ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ණණ) 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව;

(ණණණ) 1968 අංක 15 දරන කොළඹ දිස්ත්‍රික්කයේ (පහත්බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනතින් පිහිටුවන ලද කොළඹ දිස්ත්‍රික්කයේ (පහත්බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය;".

10. 1971 අංක 33 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ළළ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (එඑඑ) කොමසාරිස්වරයාගේ මතය අනුව 1971 අංක 53 දරන ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) හා පිට වීමේ අවසර පත්‍ර පනත යටතේ ඔහු විසින් ශ්‍රී ලංකාවට එවන ලද මුදල් වන්නා වූ ද වාණිජ බැංකුවක යම් ගිණුමක ඔහුගේ බැරට ඇත්තා වූ ද මුදල් ;"; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (3) මේ පනතේ 6 වන වගන්තියේ දැක්වෙන යම් සංස්ථාවක හෝ ව්‍යාපාරයක ප්‍රාග්ධනයේ යම් කොටසක් යම් තැනැත්තකුට අයිතිව ඇති අවස්ථාවක, ඒ සංස්ථාවේ හෝ ව්‍යාපාරයේ ලාභ හා ආදායම් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති කාලසීමාව යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂයේ මාර්තු 31 වන දිනට කලින් අවසාන නොවන්නේ නම් එම කොටසේ වටිනාකම එම තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ ධනයෙන් බැහැර කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) යම් තැනැත්තකු විසින් යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් සපයන ලද ධන වාර්තාව අනුව ඒ තැනැත්තා පවුලක ප්‍රධානයා වන අවස්ථාවක, ඒ පවුලේ සාමාජිකයකු වන එක් එක් පුද්ගලයාගේ ධනය ඒ පවුලේ ප්‍රධානයාගේ ධනයේ කොටසක් වශයෙන් මේ පනතේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ සාමාජිකයන් සියලු දෙනාගේ ම ශුද්ධ ධනයෙහි වටිනාකම ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පවුලේ ප්‍රධානයාගේ ශුද්ධ ධනයට එකතු කරනු ලැබිය යුතු ය. 1964 මාර්තු 31 වන දායින් අවසන් වන තක්සේරු වර්ෂය සඳහා ඒ පවුලේ ප්‍රධානයාගේ මුළු ශුද්ධ ධනය රුපියල් එක් ලක්ෂයක් වන විට හෝ ඊට වැඩි වන විට, ඒ ශුද්ධ ධනය ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ බදු අය කළ හැකි ධනය ද 1964 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ පවුලේ ප්‍රධානයාගේ ශුද්ධ ධනය රුපියල් එක් ලක්ෂයකට වැඩිවන අවස්ථාවක දී, එසේ රුපියල් එක් ලක්ෂයකට වැඩිවන ඔහුගේ ශුද්ධ ධනයේ කොටස ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ බදු අය කළ හැකි ධනය ද වන අතර ඒ බදු අය කළ හැකි ධනය වෙනුවෙන් ධන බද්ද ගෙවීමට ඒ පවුලේ ප්‍රධානයා යටත් වන්නේ ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය පහත සදහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ඉ) ඡේදය සහ (ඊ) ඡේදය වෙනුවට පහත සදහන් අලුත් ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඉ) (නොලැබෙන ණයක් වශයෙන් සලකනු ලැබ මේ පනතේ යටතේ ආදායම් බදු අය කිරීමේ කාර්යයන් සඳහා අඩු කිරීමක් වශයෙන් ඉඩ දෙනු ලැබ ඇති ණයක් නොවන) යම් ණයක් හෝ ගිවිසුමක් හෝ යම් දේපලක් සම්බන්ධයෙන් ඇති යම් අයිතියක් හෝ යම් තැනැත්තකු විසින් මුදා හරින ලද, නිදහස් කරන ලද, පවාරණය කරන ලද හෝ අත්හරින ලද අවස්ථාවක එසේ මුදා හැරීමේ, නිදහස් කිරීමේ, පවාරණය කිරීමේ හෝ අත්හැරීමේ වටිනාකම ඒ තැනැත්තා විසින් දෙන ලද තෑග්ගක් වශයෙන් සලකනු ලැබේ ;

(ඊ) ත්‍යාගකරුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ වාසියට හේතුවන පරිද්දෙන් කරන ලද වෙන් කිරීමකට යටත්ව 1958 ජූලි 18 වන දින හෝ ඊට පසුව යම් දේපලක් තෑගි කරනු ලබන්නේ ද එම වෙන් කිරීම නිසා ඇති වන අයිතිය අහෝසි වන අවස්ථාවේ නොව තෑගි කිරීම කරනු ලැබූ අවස්ථාවේ එම තෑගි කිරීම ක්‍රියාත්මක වූවාක් සේ සලකනු ලැබේ ; සහ" ; තවද

(2) ඒ වගන්තියේ අගට පහත සදහන් අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(උ) (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින් තමාගේ පවුලේ යම් සාමාජිකයකුට හෝ තම පවුලට ඇතුලත් නැති තමාගේ හෝ තම භාර්යාවගේ/ස්වාමි පුරුෂයාගේ යම් පුතකුට හෝ දුවකට යම් දේපලක් පවරන ලද අවස්ථාවක සහ ඒ පැවරුම් සඳහා වූ සම්පූර්ණ ප්‍රතිෂ්ඨාව හෝ ඉන් කොටසක් පවරන්නාගේ වාසියට හේතුවන්නා වූ ණයක් හෝ වාර්ෂිකයක් වන අවස්ථාවක ඒ ණය හෝ වාර්ෂිකය නොසලකා හැරිය යුතු අතර, එසේ ඇති වූ ණයෙහි හෝ වාර්ෂිකයෙහි වටිනාකමේ ප්‍රමාණයට පවරන්නා විසින් ඒ දේපළ පැවරුම්ලාභියාට තෑග්ගක් වශයෙන් දුන් ලෙස සලකනු ලැබේ.".

13. 1971 අංක 31 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය පහත සදහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සදහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (2ආ) වන සහ (4ආ) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, විවාහක ස්ත්‍රියක් සම්බන්ධයෙන්,

විවාහය යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව ම වූ වර්ෂයක කොටසක් තුළ පමණක් පවතින අවස්ථාවක,—

(අ) ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂයේ ඒ විවාහය පවත්නා දින ගණන හා ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂයේ මුළු දින ගණන හා අතර ඇති අනුපාතයම ඒ තක්සේරු වර්ෂයේ භාර්යාවගේ තක්සේරු කළ හැකි ආදායමේ යම් කොටසක් හා මුළු ආදායම හා අතර ඇතිවේද ඒ කොටසට පමණක් V වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ වන්නේ ය;

(ආ) ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂයේ ඒ විවාහය පවත්නා දින ගණන හා ඒ තක්සේරු වර්ෂයට පෙරාතුවම වූ වර්ෂයේ මුළු දින ගණන හා අතර ඇති අනුපාතයම භාර්යාවගේ ශුද්ධ ධනයේ යම් කොටසක් හා මුළු ශුද්ධ ධනය හා අතර ඇති වේද ඒ කොටසට පමණක් VII වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ වන්නේ ය;

(ඇ) යම් වර්ෂයක විවාහය පවත්නා කාල පරිච්ඡේදය තුළ අවස්ථාවෝචිත පරිදි (භාර්යාවගේ) ලාභ හෝ ආදායම් මාර්ගයක් හෝ ශුද්ධ ධනය හෝ නොවන යම් ලාභ හෝ ආදායම් මාර්ගයකට හෝ ශුද්ධ ධනයට ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවන්නේ ය;"; තව ද

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) (2ආ) වන උපවගන්තියේ හා (4ආ) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, විවාහක ස්ත්‍රියක් සම්බන්ධයෙන්, ඇයගේ විවාහය යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව ම වූ වර්ෂයේ අප්‍රේල් මස පළමුවන දිනට පසු දිනයක සිදුවන අවස්ථාවක හෝ විවාහය ඒ පෙරාතුව ම වූ වර්ෂයේ කොටසක් තුළ පමණක් පවතින අවස්ථාවක ආදායම් බද්ද සඳහා ඇගේ ආදායම ද ධන බද්ද සඳහා ඇගේ ධනය ද—

(අ) ඇය විවාහ වූ දිනයට පෙර ඇය පවුලකට ඇතුළත් කරනු නොලැබූ පුද්ගලයකුව සිටියා නම් පෙරාතුව වූ වර්ෂයේ අප්‍රේල් මස පළමුවන දින ආරම්භව විවාහ වූ දිනයෙන් අවසන් වූ කාලය සඳහා, හෝ

(ආ) ඒ පෙරාතුව ම වූ වර්ෂයේ විවාහය නොපවත්නා කාලපරිච්ඡේදය සඳහා හෝ

වෙන වෙනම තක්සේරු කරනු ලැබිය යුතු අතර බදු එකතු කිරීම හා අයකරගැනීම සම්බන්ධයෙන් මේ පනතේ ඇති විධිවිධාන එපරිද්දෙන් ඇයට අදාළ වන්නේය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"දරුවකුගේ ආදායම වෙනම තක්සේරු කිරීම.

46. යම් තක්සේරු වර්ෂයක් සඳහා තමාගේ තක්සේරු කළ හැකි ආදායම රුපියල් පන් සියයකට වැඩි වන දරුවකු ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂය තුළ විසිපස්වන වියට පත්වන හෝ විවාහ වන හෝ ඔහුගේ දෙමව්පියන්ගේ නිවස හැරයන අවස්ථාවක, ඔහු එසේ ඒ වියට පත්වන හෝ විවාහ වන හෝ ඔහුගේ දෙමව්පියන්ගේ නිවස හැරයන හෝ දිනයෙන් ආරම්භ වී ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂයේ අවසාන දිනයෙන් අවසාන වන කාලය තුළ ඔහුගේ (සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම නොවන) ආදායම සහ ඔහු එසේ වියට පත්වන හෝ විවාහ වන හෝ ඔහුගේ දෙමව්පියන් ගේ නිවස හැරයන දිනයෙන් ආරම්භ වී ඒ තක්සේරු වර්ෂයේ අවසාන දිනයෙන් අවසන් වන කාලය තුළ සේවා නියුක්තියෙන් ලැබෙන ඔහුගේ ආදායම ඔහුගේ මවගේ හෝ පියාගේ ආදායමට එකතු කරනු නොලැබිය යුතු ය.".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) හවුල් ව්‍යාපාරයේ යම් හවුල්කරුවකුගේ ව්‍යවස්ථාපිත ආදායම, හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභයේ ඔහුගේ කොටස ඔහු විසින් කරගෙන යනු ලැබූ හෝ ඔහු යෙදුනාවූ යම් කර්මාන්තයකින්, වෙළෙඳ ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රක්ෂාවකින් හෝ සේවා නියුක්තියකින් ලැබූ ලාභ ලෙස ද, අනිකුත් ආදායම්වල ඔහුගේ කොටස ඔහු තනිව ලැබූ ආදායම ලෙස ද සලකා 12 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ගණන් බැලිය යුතු ය :

එසේ වුව ද (2) වන උපවගන්තියෙන් නියමිත වූ පරිදි වාර්තාවක් සපයා නොමැති විටක හෝ ඒ උපවගන්තිය යටතේ සපයනු ලැබූ වාර්තාවක් භාරගනු නොලැබූ විටක යම් හවුල්කරුවකු විසින් හවුල් ව්‍යාපාරයෙන් ලැබූ ව්‍යවස්ථාපිත ආදායම තක්සේරුකරු විසින් ස්වකීය උපරිම විනිශ්චය අනුව තක්සේරු කළ හැකි ය :

එසේ ම තවදුරටත් හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ හවුල් කරුවකු විසින් නතුකොටගෙන ඇති බව තක්සේරුකරුගේ මතය වූ විටක තක්සේරුකරු විසින් ඒ හවුල්කරු ලබාගෙන ඇති ලාභ ප්‍රමාණය හවුල් ව්‍යාපාරයේ බෙදිය

හැකි ලාභයේ ඒ හවුල්කරුගේ කොටසට ඇතුළත් කරනු ලැබිය හැකි අතර ඒ හවුල්කරුගේ ව්‍යවස්ථාපිත ආදායම ඒ අනුව ගණන් බලනු ලැබිය හැකි ය. " ; තව ද

(2) ඒ වගන්තිය අගට පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (10) හවුල් ව්‍යාපාරයක, හවුල්කරුවකු වූ යම් තැනැත්තකුගේ යම් තක්සේරු වර්ෂයක ව්‍යවස්ථාපිත ආදායමට හවුල් ව්‍යාපාරයේ ඔහුගේ බෙදිය හැකි ලාභයේ කොටස ඇතුළත් වන්නා වූ ද ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බද්ද ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද අවස්ථාවක, ගෙවීම පැහැර හැර ඇති ඒ බද්දෙන් කොමසාරිස්ගේ මතය අනුව බෙදිය හැකි ලාභයේ ඔහුගේ කොටසට ආරෝපණය කළ හැකි කොටස හවුල් ව්‍යාපාරයේ වත්කම් වලින් අයකොට ගත හැකි අතර ඒ අනුව 110 වන වගන්තියේ කාර්යයන් සඳහා හවුල් ව්‍යාපාරයේ වත්කම් හවුල්කරුගේ වත්කම් ලෙස සැලකිය යුතු ය :

එසේ වුව ද එලෙස අය කර ගනු ලැබූ මුදල හවුල්කරුට හවුල් ව්‍යාපාරයේ ඇති අයිතිය නොඉක්මවිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** 1971 අංක 31 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය පහත සඳහන් පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (7) උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (7) පුද්ගලයකු 1970 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ දී ශ්‍රී ලංකාවට පැමිණ ඒ තක්සේරු වර්ෂය තුළ දී හෝ ඒ තක්සේරු වර්ෂයට පසුව එන වර්ෂය තුළ දී යම් සේවා නියුක්තියක් කරගෙන යන හෝ යම් සේවා නියුක්තියක යෙදී සිටින අවස්ථාවක ඒ තත්ත්වය යටතේ අවශ්‍ය විය හැකි යම් සහන සැලසීමේ කාර්යය සඳහා ඒ පුද්ගලයා ඉහත කී තක්සේරු වර්ෂ අතුරින් එක් එක් තක්සේරු වර්ෂයට පෙරාතුව වූ සම්පූර්ණ වර්ෂය තුළ හෝ ඉන් කොටසක් තුළ හෝ ඒ වර්ෂ අතුරින් යම් සම්පූර්ණ වර්ෂයක් තුළ හෝ ඉන් කොටසක් තුළ නේවාසිකව සිටි ලෙස සලකනු ලැබිය යුතු බවට කොමසාරිස්වරයා විසින් විධාන කළ හැකි ය. " ; සහ

(2) ඒ වගන්තියේ අවසානයට පහත සඳහන් අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

" (8) පුද්ගලයකු 1970 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ දී ශ්‍රී ලංකාව හැර යන අවස්ථාවක, ඔහු ශ්‍රී ලංකාව හැර යන දිනයෙන් ආරම්භව ඔහු ශ්‍රී ලංකාව හැර යන්නේ යම් තක්සේරු වර්ෂයක් තුළ ද ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ තක්සේරු වර්ෂයේ මාර්තු මස තිස්එක් වන දින අවසන් වන කාලය තුළදී ශ්‍රී ලංකාවෙන් බැහැර

යම් ස්ථානයක සේවා නියුක්තියකින් ඇතිවන හෝ ලබාගන්නා ඔහුගේ ලාභ සහ ආදායම, ඒ කාලය තුළ යම් අවස්ථාවක ඔහු ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටිතහොත් හෝ නේවාසිකව සිටිනා ලෙස සලකනු ලැබුවහොත් හෝ මිස, ආදායම් බද්දෙන් නිදහස් වන්නේ ය.

(9) 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ අර්ථානුකූල වූ ලංකාවේ නැවක සේවයෙහි යොදවනු ලැබ සිටින පුද්ගලයකු, ඔහු එසේ සේවයේ යෙදී සිටින කාලය තුළ ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටින ලෙස මේ පනතේ කාර්යයන් සඳහා සලකනු ලබන්නේ ය:

එසේ වුවද එවැනි යම් පුද්ගලයකු ශ්‍රී ලංකාව නොවන වෙනත් රටක පුරවැසියකු හෝ යටත්වැසියකු හෝ වන අවස්ථාවක, ඔහු එසේ ශ්‍රී ලංකාවේ නේවාසිකයකු වශයෙන් සලකනු ලැබීම නිසා, ඔහු ඒ නැවේ සේවයෙන් ලබන ආදායම නොවන යම් ආදායමක් සම්බන්ධයෙන් නේවාසිකයකු වශයෙන් ආදායම් බදු ගෙවීමට යටත් නොවන්නේ ය.".

17. 1971 අංක 31 දරන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලැබූ 69අ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 69අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"1971 අප්‍රේල් 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයෙහි සේවයෙන් ලබන ලාභ වෙනුවෙන් වූ ආදායම් බද්දෙන් කරනු ලබන අඩු කිරීම.

69අ. 1971 අප්‍රේල් 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා පුද්ගලයකුගේ ලාභ වලට හා ආදායමට සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම ඇතුළත් වන අවස්ථාවක, 1971 අප්‍රේල් 1 වන දින සිට 1971 සැප්තැම්බර් 30 වන දිනය දක්වා වූ කාලය තුළ ඒ පුද්ගලයා සේවා නියුක්තියක් කරගෙන ගිය හෝ සේවා නියුක්තියක යෙදී සිටි දින ගණන හා ඔහු සේවා නියුක්තියක් කර ගෙන ගිය හෝ සේවා නියුක්තියක යෙදී සිටි මුළු දවස් ගණන හා අතර ඇති අනුපාතයම සේවයෙන් ලබන ඒ ලාභවල යම් කොටසක් හා සම්පූර්ණ ලාභ හා අතර ඇතිවේ ද ඒ කොටස සඳහා බලපවත්නා ප්‍රමාණය අනුව වූ ආදායම් බද්දට සමාන මුදලක්, ඒ පුද්ගලයා විසින් හෝ ඒ පුද්ගලයා පවුලක සාමාජිකයකු වන්නේ නම් ඒ පවුලේ ප්‍රධානයා විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවනු ලබන ආදායම් බද්දෙන් අඩු කරනු ලැබීමට අවස්ථාවෝචිත පරිදි ඒ පුද්ගලයාට හෝ ඒ පුද්ගලයා සාමාජිකයා වන පවුලේ ප්‍රධානයාට හිමිකම් ඇත්තේ ය:

එසේ වුවද මේ වගන්තියේ කාර්යයන් සඳහා සේවා නියුක්තියෙන් ලැබෙන ලාභවලට 3 (4) (අ) (ii) වන වගන්තිය යටතේ ගැණෙන යම් මුදලක් ඇතුළත් නොවන්නේ ය.

මේ වගන්තියේ කාර්යයන් සඳහා—

(අ) 1971 අප්‍රේල් 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා බලපවත්නා බදු ප්‍රමාණය, ඒ තක්සේරු වර්ෂය සඳහා තක්සේරු කළ හැකි ආදායම් ප්‍රමාණය හා 27 වන වගන්තිය, හෝ 66 වන වගන්තිය, හෝ 70 වන වගන්තිය හෝ 71 වන වගන්තිය යටතේ යම් සහනයක් සඳහා යම් අඩු කිරීමක් නොමැතිව ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බදු මුදල හා අතර වූ ප්‍රතිශතය වන්නේ ය; තවද

(ආ) 1971 අප්‍රේල් 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ වර්ෂයේ යම් කොටසක් සඳහා යම් තැනැත්තකු විශ්‍රාම වැටුපක් ලබන අවස්ථාවක ඒ තැනැත්තා එම විශ්‍රාම වැටුප ලබන කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් සේවා නියුක්තියක් කරගෙන යන හෝ සේවා නියුක්තියක යෙදී සිටින ලෙස සැලකිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 73අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 73අ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඇතැම් ලාභ හා ආදායම සම්බන්ධයෙන්වූ සහන.

73අ. 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන ඡේදයෙහි හෝ (vi) වන ඡේදයෙහි සඳහන් කරනු ලබන්නා වූ ද එය යටතේ 1976 අප්‍රේල් 1 වන දිනට පෙර අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්තා වූ ද ව්‍යාපාරයක් සමාගමක් විසින් පවත්වා ගෙන යනු ලබන අවස්ථාවක, ඒ වගන්තියෙහි (2) වන උපවගන්තිය යටතේ එම ව්‍යාපාරයේ ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස් වන පස් අවුරුදු කාලසීමාවට ඉක්බිතිව ම එළඹෙන අවුරුදු පහළොවේ කාලසීමාව සඳහා එම ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ හා ආදායම සම්බන්ධයෙන් ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද නියමිත මුදලින් සියයට පණහකට සමාන මුදලකින් අඩු කරනු ලැබීමට ඒ සමාගම හිමිකම් ලැබිය යුතු ය.

මේ වගන්තියෙහි කාර්යයන් සඳහා ඒ නියමිත මුදල—

(අ) නේවාසික සමාගමක් සම්බන්ධයෙන් වූ විට,—70 වන වගන්තිය හෝ 71 වන වගන්තිය හෝ යටතේ දෙනු ලැබූ යම් සහනයක් අඩු කිරීමෙන් පසු, 25 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා

ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දට ඒ ව්‍යාපාරයේ ලාභ හා ආදායමත් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ ලාභ හා ආදායමත් අතර ඇති අනුපාතයම දරන මුදලක් ; සහ

(ආ) නේවාසික නොවන සමාගමක් සම්බන්ධයෙන් වූ විට, 70 වන වගන්තිය හෝ 71 වන වගන්තිය හෝ යටතේ දෙනු ලැබූ යම් සහනයක් අඩුකිරීමෙන් පසු, (26 වන වගන්තිය යටතේ සියයට 6 බැගින් වූ අතිරේක ප්‍රමාණය අනුව හෝ සියයට 33⅓ බැගින් වූ ප්‍රමාණය අනුව හෝ ගණන් බලන ලද ආදායම් බද්දේ කොටස හැර) 26 වන වගන්තිය යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දට, ඒ ව්‍යාපාරයේ ලාභ හා ආදායමත් ඒ සමාගමේ ලාභ හා ආදායමත් අතර ඇති අනුපාතයම දරන මුදලක්

විය යුතු ය.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියෙහි 79 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(1) පස් දෙනකුට වැඩි නොවන තැනැත්තන් සංඛ්‍යාවක් විසින් පාලනය කරනු ලබන සමාගමක් සම්බන්ධයෙන් වූ විට—

(අ) යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමෙහි තක්සේරු කළ හැකි ආදායම, 1962 අප්‍රේල් මස පළමු වන දින හෝ ඉන් පසුව අවසන් වන (මේ වගන්තියෙහි මින් මතු "කලින් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් වර්ෂයක් සඳහා සමාගමේ ලාභ අනුව ගණන් බලනු ලබන අවස්ථාවක ; සහ

(ආ) කලින් වර්ෂය සම්බන්ධයෙන් සමාගම තම ලාභ වලින් සාධාරණ කොටසක් තම කොටස්කරුවන්ට බෙදා දී නැති බවට තක්සේරුකරු සෑහීමට පත් වූ අවස්ථාවක,

පවත්නා වෙළෙඳ ව්‍යාපාරයක් හෝ කාර්මික ව්‍යාපාරයක් මිලයට ගැනීම සඳහා ගෙවනු ලැබූ මිල හැර සමාගමෙහි ව්‍යාපාරයේ සංවර්ධනය සඳහා දරනු ලැබූ යම් වියදමක් අඩු කිරීමෙන් පසු, සමාගමේ සම්පූර්ණ ලාභ හෝ එයින් කොටසක් තක්සේරුකරු විසින් නිශ්චය කරනු ලැබූ දිනයක දී සමාගමේ කොටස්කරුවන්ට ලාභාංශ වශයෙන් බෙදා දුන් ලෙස (2), (3) හා (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව තක්සේරුකරු විසින් සලකනු ලැබිය හැකි අතර සම්බන්ධිත තැනැත්තන් එසේ නිශ්චය කරනු ලැබූ දිනයට ඉක්බිතිව යෙදෙන අප්‍රේල් මස පළමු වන දිනයෙන්

ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඔවුනට ලාභාංශ වශයෙන් බෙදා දුන් ලෙස සලකනු ලබන මුදල වෙනුවෙන් තක්සේරු කළ හැකි වන්නේ ය.

(2) සමාගමක් විසින් තම කොටස්කරුවන්ට එහි ලාභ වලින් සාධාරණ කොටසක් බෙදා දෙන ලද්දේ ද නැද්ද යන්න (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කිරීමේ දී තක්සේරුකරු විසින්—

(අ) එහි ලාභවල මුළු ප්‍රමාණය ;

(ආ) සමාගම සම්බන්ධයෙන් යම් අතිරේක තක්සේරුවක් කරනු ලැබ ඇත්නම් එය ;

(ඇ) සමාගමේ වෙළෙඳ ව්‍යාපාරයෙහි තත්කාලයෙහි පවත්නා වූ අවශ්‍යතාවන් ;

(ඈ) සමාගමේ වෙළෙඳ ව්‍යාපාරයෙහි නඩත්තුව සහ සංවර්ධනය සඳහා වුවමනා හෝ ප්‍රඥාගෝචර විය හැකි වෙනත් අවශ්‍යතා

සැලකිල්ලට ගත යුතු ය." ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුලත් කිරීමෙන් :—

" (4අ) සමාගමේ සම්පූර්ණ ලාභ හෝ ඉන් කොටසක් සමාගමේ කොටස්කරුවන්ට ලාභාංශ වශයෙන් බෙදා දුන් ලෙස (1) වන උපවගන්තිය යටතේ තක්සේරුකරු විසින් සලකනු ලබන අවස්ථාවක—

(අ) ලාභාංශ වශයෙන් බෙදා දුන් ලෙස සැලකෙන ලාභ සම්බන්ධයෙන් 27 වන වගන්තියේ විධිවිධාන අදාල නොවන්නේ ය ;

(ආ) ලාභාංශ වශයෙන් බෙදා දුන් ලෙස සැලකෙන නියම මුදල් ප්‍රමාණය මත කොටස්කරුවන්ගේ ආදායම තක්සේරු කළ හැකි විය යුතු අතර 27 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ යම් හිලව් කිරීමක් සඳහා ඔවුනට අයිතියක් නොමැත්තේ ය ; තවද

(ඇ) කොටස්කරු සමාගමක් වන කල්හි, ඒ සමාගමට ලාභාංශ වශයෙන් බෙදා දුන් ලෙස සැලකෙන ලාභ, මේ පනතෙහි වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් ව ඇත ද, සමාගමේ තක්සේරු කළ හැකි ආදායමෙහි කොටසක් ලෙස සැලකිය යුතු අතර ඒ අනුව තක්සේරු කළ යුතු ය. ".

79අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 79අ වන වගන්තිය ලෙස බල පවත්වන්නේ ය :—

" සමාගමක ලාභ සහ ආදායම ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින් නතු කර ගන්නා අවස්ථාවක අදාල වන විධිවිධාන.

79අ. සමාගමක ලාභ සහ ආදායම හෝ එවැනි ලාභවල සහ ආදායමෙහි යම් කොටසක් ඒ සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, කොටස් කරුවකු හෝ විධායක නිලධරයකු විසින් නතු කර ගන්නා ලද අවස්ථාවක එම ලාභ සහ ආදායම හෝ එවැනි ලාභවල සහ ආදායමෙහි යම් කොටසක්, එම ලාභ හෝ ආදායම හෝ එහි කොටස නතු කර

ගත් තැනැත්තාගේ ද, ඒ සමාගමේ ද ලාභවල සහ ආදායමෙහි කොටසක් වන අතර, ඒ තැනැත්තාගේ සහ ඒ සමාගමේ ආදායම ඒ අනුව තක්සේරු කළ යුතු ය.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

සමාගමක් හෝ "පුද්ගල" මණ්ඩලයක් වෙනුවට ප්‍රධාන නිලධරයා ක්‍රියා කළ යුතු බව.

90. (1) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නො කළ සෑම සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා මේ පනතේ විධිවිධාන යටතේ එවැනි සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබීමට නියමිත සියලු ක්‍රියා, කරුණු සහ දේවල් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය :

එසේ වුවද සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවට මේ පනත් යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු සමාගම සමග හෝ පුද්ගල මණ්ඩලය සමග තමාගේ සම්බන්ධයක් නොමැති බව හෝ ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටින අන් තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා බව ඔප්පු කරතහොත් මිස, ඔහු එහි ප්‍රධාන නිලධරයා ලෙස සලකනු ලැබේ.

(2) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේහි හෝ පුද්ගල මණ්ඩලයෙහි හෝ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ වෙනත් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකු ම ඒ වරද කර ඇත්තේ තමාගේ දැනුම නොමැතිව බව සහ එම තනතුරෙහි තම කාර්යවල ස්වභාවය හා යෙදී ඇති සියලු කරුණු ගැන සැලකිලිමත් ව එම වරද කිරීම වැළැක්වීමට ක්‍රියා කළ යුතු වූ පරිදි නිසි සියලු උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔප්පු කරතහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබේ.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ, 1971 අංක 31 දරන පනතින් එයි ඇතුළත් කරන ලද, 107ඇ වන වගන්තිය, ඒ වගන්තිය අගට පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 107ඇ වන වගන්තිය සංශෝධනය කිරීම.

"(8) සේවකයකු විසින් මේ වගන්තිය යටතේ සපයන ලද ප්‍රකාශයක දක්වා ඇති යම් විස්තරයක් වැරදි යැයි සැක කිරීමට සේවා යෝජකයකුට සැහෙන හේතු තිබෙන අවස්ථාවක තම සැකයට තුඩු දුන් කරුණු ඔහු විසින් වහාම කොමසාරිස් වෙත දැන්විය යුතු අතර, එම ප්‍රකාශයෙහි පිටපතක් ද ඔහු වෙත යැවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 107උ වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** 1974 අංක 31 දරන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කරන ලද 107උ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

'(2අ) මේ පනත යටතේ ආදායම් බදු අය කරනු ලැබිය හැකි යම් සේවකයකු සම්බන්ධයෙන් කොමසාරිස් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ ඒ සේවකයාගේ සේවායෝජක වන හෝ, කොමසාරිස්ගේ හෝ එම නිලධරයාගේ මතය අනුව එම සේවකයාගේ සේවායෝජක වන තැනැත්තා වෙත ලියවිල්ලකින් කරනු ලබන (පිටපතක් සේවකයා වෙත නිකුත් කළ යුතු) විධානයකින් මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද එම සේවකයාගේ පාරිශ්‍රමිකයෙන් එම විධානයට අනුකූලව අඩු කරන ලෙස විධාන කරනු ලැබිය හැකි අතර එම විධානයට අනුකූලව එම තැනැත්තා විසින් ඒ පාරිශ්‍රමිකයෙන් එම ආදායම් බද්ද අඩු කළ යුතු යි:

එසේ වුව ද එබඳු යම් විධානයක් යම් අවස්ථාවක වෙනස් කළ හැකි ය.

මේ පරිච්ඡේදයේ කාර්යයන් සඳහා මේ වගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා "නිශ්චිතව සඳහන් කරන ලද සේවකයකු" ලෙස සලකනු ලැබේ'; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) (2) වන උපවගන්තිය යටතේ හෝ (2අ) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයකින් අතෘප්තියට පත් යම් සේවකයකු විසින් ඒ විධානය නිකුත් කළ දිනයට ඉක්බිතිව දින තිහක කාලයක් ඇතුළත, අභියාචනයෙහි හේතු නිශ්චිතව දක්වමින් කොමසාරිස් වෙත ලියවිල්ලකින් අභියාචනා කළ හැකි ය. එබඳු අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස්ගේ තීරණය අවසානාත්මක හා නිරණාත්මක වන්නේ ය.".

107ඣ වන වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 107ණ වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 107ඣ වන වගන්තිය ලෙස බලපවත්වන්නේ ය :—

" ආකෘති ආදිය සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව ක්‍රියා කළ යුතු බව.

107ඣ. කොමසාරිස් විසින් නියම කරනු ලබන ආකෘතියෙහි සහ එසේ නියම කරනු ලබන ආකාරයට විස්තර සටහන් කිරීමට හෝ සැපයීමට මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ සේවා යෝජකයකුට නියම කරනු ලබන අවස්ථාවක, සේවා යෝජකයා විසින් කරන ලද ඉල්ලීමක් මත

කොමසාරිස් විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද ආකෘතියක සහ එසේ අනුමත කරන ලද ආකාරයට සේවා යෝජකයා විසින් විස්තර සටහන් කිරීම හෝ සැපයීම කරනු ලැබුවහොත් එය ඒ විධි විධානවලට ප්‍රමාණවත් ලෙස අනුකූලව ක්‍රියා කිරීමක් වන්නේ ය.".

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මේ පනතේ කාර්යයන් සඳහා දේශීය ආදායම් කොමසාරිස්වරයකු, අතිරේක දේශීය ආදායම් කොමසාරිස්වරයකු, නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ දේශීය ආදායම් කොමසාරිස්වරයකු සහ නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරුන්, සහකාර දේශීය ආදායම් කොමසාරිස්වරුන් සහ දේශීය ආදායම් තක්සේරුකරුවන් අවශ්‍ය විය හැකි සංඛ්‍යාවක් ද පත් කළ යුතු ය.".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "සක්‍රිය හවුල්කරු" යන්නේ අර්ථකථනයට ඉක්බිතිව ම පහත සඳහන් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' "අතිරේක කොමසාරිස්" යන්නෙන් මේ පනත යටතේ පත් කරන ලද අතිරේක දේශීය ආදායම් කොමසාරිස්වරයෙක් අදහස් වේ ;' ;

(2) "කෘෂිකාර්මික ව්‍යාපාරය" යන්නේ අර්ථකථනයට ඉක්බිතිව ම පහත සඳහන් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'1973 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂයක කාර්යයන් සඳහා "වාර්ෂිකය" යන්නේ මුදලින් හෝ මුදලේ වටිනාකමින්—

(අ) දික්කසාද දීමනාවක හෝ නඩත්තු ගෙවීමක ස්වරූපයේ ගෙවීමක් වන අධිකරණයේ ආඥාවක් යටතේ යම් තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකුට ගෙවනු ලබන්නා වූ, හෝ

(ආ) යථා පරිදි ලියා අත්සන් කරන ලද වෙන්වීමේ ඔප්පුවක් යටතේ එක් ස්වාමි පුරුෂයකු හෝ භාර්යාවක හෝ විසින් අනෙක් පාර්ශ්වයට ගෙවනු ලබන්නාවූ, හෝ

(ඇ) යම් තැනැත්තකු විසින් මුදලින් හෝ මුදලේ වටිනාකමින් වූ ද සම්පූර්ණ ප්‍රතිෂ්ඨාව ආපසු ගෙවීම වශයෙන් වූ ද ඒ තැනැත්තාගේ හෝ ඔහුගේ භාර්යාවගේ පුත්‍රයා, දියණිය,

පියා, මව, සහෝදරයා හෝ සහෝදරිය නොවන වෙනත් යම් නෑයකුට ගෙවනු ලබන්නාවූ,

හෝ (ප්‍රාග්ධන ස්වරූපයේ ගෙවීමක් නොවන) වාර්ෂික ගෙවීමක් අදහස් වේ;';

(3) "වෙළෙඳ ව්‍යාපාරය" යන්නේ අර්ථකථනයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"ලංකා සංචාරක මණ්ඩලය" යන්නෙන් 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටු වන ලද ලංකා සංචාරක මණ්ඩලය අදහස් වේ;';

(4) "කොමසාරිස්" යන්නේ අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"කොමසාරිස්" යන්නෙන් මේ පනත යටතේ පත් කරනු ලැබූ දේශීය ආදායම් කොමසාරිස් අදහස් වන අතර අතිරේක කොමසාරිස්වරයෙක්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයෙක්, නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් සහ කොමසාරිස් වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ කාර්යයක් සඳහා හෝ ක්‍රියා කිරීමට ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ සහකාර කොමසාරිස්වරයෙක් එයට ඇතුළත් වෙති;';

(5) "සමාගම" යන්නේ අර්ථකථනයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"විනිමය පාලක" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ලෙස නාමෝද්දේශනය කරනු ලැබූ නිලධරයා අදහස් වේ;';

(6) "ලාභාංශය" යන්නේ අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"ලාභාංශය" යන්නට සමාගමක් විසින් මුදල් වශයෙන් හෝ මුදල් ගෙවීම සඳහා වූ ඇණවුමක් වශයෙන් සමාගමෙහි හෝ වෙනත් යම් සමාගමක කොටස් හෝ ණය පත්‍ර වශයෙන් එහි කොටස්කරුවන්ට කරනු ලබන යම් ලාභ බෙදාදීමක් හා ප්‍රාග්ධනය ආපසු දීමේ හෝ බෙදාදීමේ දිනයට පෙරාතුව ම වූ අවුරුදු හය ඇතුළත සමාගම විසින් එහි කොටස් කරුවන්ට බෙදා දෙන ලද යම් කොටස්වල, සමාගමේ මුළු ලාභ ප්‍රමාණය හෝ එයින් යම් කොටසක් හෝ ප්‍රාග්ධනය බවට හැරවීම දක්වන ගෙවා නිමි අගය වන්නා වූ ගෙවා නිමි අගයෙහි ප්‍රමාණයට ආපසු දෙන ලද හෝ බෙදා දෙන ලද හෝ යම් ප්‍රාග්ධන ප්‍රමාණයක් ඇතුළත් වන අතර—

(අ) ස්ථාවර ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභ මේ පනතේ විධිවිධාන යටතේ අයබදු ගෙවීමට යටත් නොවන අවස්ථාවක දී සම්පූර්ණයෙන් ම ඒ ලාභවලින් කරනු ලැබූ බෙදා දීමක්,

(ආ) ගෙවා නිමි අගය, සමාගමේ මුළු ලාභ ප්‍රමාණය හෝ එයින් කොටසක් හෝ ප්‍රාග්ධනය බවට හැරවීම දක්වන ප්‍රමාණයට එහි කොටස් කරුවන්ට සමාගම විසින් බෙදා දෙනු ලැබූ යම් කොටස්වල ගෙවා නිමි අගය

ඇතුළත් නොවේ ;' ;

(7) "පවුල" යන්නේ අර්ථකථනයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"විදේශීය ව්‍යවහාර මුදල්" යන්නෙහි විනිමය පාලන පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත ;' ;

(8) "කාර්මික ව්‍යාපාරය" යන්නේ අර්ථකථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ අර්ථානුකූල ඉතිරිකිරීමේ සහතිකයක් සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ "පොළිය" යන්නෙන්—

(අ) ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ (මෙහි මින් මතු "පෙරාතුව වූ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) වර්ෂය ආරම්භ වීමට පෙර යම් තැනැත්තකු විසින් ඒ සහතිකය අත්කරගෙන පෙරාතුව වූ සම්පූර්ණ වර්ෂය තුළ හෝ ඉන් කොටසක් තුළ ඔහු එය දරමින් සිටි අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, පෙරාතුව වූ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දින හෝ ඒ තැනැත්තා ඒ සහතිකයේ ධාරකයාව සිටීම අවසන් වන දින ඒ සහතිකයේ පවාරණ අගය, පෙරාතුව වූ වර්ෂයේ අප්‍රේල් මස පළමු වන දින ඒ සහතිකයේ පවාරණ අගයක් ඇති හෝ නැති බව අනුව වූ, ඉහත සඳහන් අප්‍රේල් මස පළමු වන දින ඒ සහතිකයේ පවාරණ අගය හෝ ඒ සහතිකයේ ගැනුම් මිල ඉක්මවන මුදල අදහස් වන අතර

(ආ) පෙරාතුව වූ වර්ෂය ආරම්භ වීමෙන් පසුව යම් තැනැත්තකු විසින් ඒ සහතිකය අත්කර ගෙන පෙරාතුව වූ වර්ෂයේ ඉතිරිව ඇති සම්පූර්ණ කාලය තුළ හෝ ඉන් කොටසක් තුළ ඔහු එය දරමින් සිටි අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, පෙරාතුව වූ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දින හෝ ඒ

තැනැත්තා ඒ සහතිකයේ ධාරකයා ව සිටීම අවසන් වන දින ඒ සහතිකයේ පවාරණ අගය, අත්කර ගැනීමේ දින ඒ සහතිකයේ පවාරණ අගයක් ඇති හෝ නැති බව අනුව වූ, ඒ සහතිකය අත්කර ගැනීමේ දින ඒ සහතිකයේ පවාරණ අගය හෝ ඒ සහතිකයේ ගැනුම් මිල ඉක්මවන මුදල අදහස් වේ ;';

(9) "නේවාසික" යන්නේ අර්ථකථනයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්" යන්නෙන් මේ පනත යටතේ පත් කරන ලද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරයා අදහස් වේ ;'; තව ද

(10) "බදු අය කළ හැකි ආදායම" යන්නේ අර්ථකථනයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"සංචාරකයා" යන්නෙන් ශ්‍රී ලංකාවෙහි පුරවැසියකු නොවන්නා වූ ද ආගාමික හා විගාමික පනත යටතේ බලයලත් නිලධරයකු විසින් ඔහු වෙත නිකුත් කරන ලද පිටසනක් දරන වලංගු ගමන් බලපත්‍රයක් දරන්නා වූ ද යම් තැනැත්තෙක් අදහස් වේ ;'.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

27. 1965 අංක 18 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයෙහි "ලංකාණ්ඩුව විසින් මුළුමනින් ම හෝ කොටසක් සපයන ලද ප්‍රාග්ධනයෙන් පිහිටුවනු ලබන රාජ්‍ය සංස්ථා" යන විෂයයට ඉක්බිති ව ම පහත දැක්වෙන අලුත් විෂය ඇතුළත් කිරීමෙන්, එම උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

| | |
|---|---|
| "1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්කරගනු ලැබූ හෝ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ වෙළෙඳ ව්‍යාපාර— | නේවාසික සමාගම් සම්බන්ධයෙන් අය කළ හැකි බදු ප්‍රමාණය.". |